// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1776/16 - 2012 සැප්තැම්බර් මස 19 වැනි බදාදා - 2012.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 277/40.

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

(188 වන අධිකාරය වූ) පුරා වස්තු ආඥාපනතේ 46 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එහි 47 වැනි වගන්තිය යටතේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ආචාර්ය ජගත් බාලසූරිය,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2012 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2012 ජූනි මස 22 වැනි දින, අංක 1763/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පුරාවස්තු තෑගි අරමුදල නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එම නියෝගවල 1 වැනි නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"1. මෙම නියෝග 2012 අංක 1 දරන පුරාවස්තු තෑගි අරමුදල යනුවෙන් හඳුන්වනු ලැබේ." ;

(2) එම නියෝගවල 1 වන උපලේඛනයේ (i) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

| | | |
|---|---|---|
| "(i) | ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකු හෝ යම් පුරාවස්තුවක් අපනයනය කිරීම අනාවරණය කරගන්නාවූ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ වෙනත් රාජ්‍ය ආයතනයක නිලධරයකු | 30%" |

10 - 232

1A - G 016612 — 340 (2012/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.